# නොනගතයට වැඩ ඇල්ලීම

දැනට වසර කිහිපයකට පෙර අළුත් අවුරුද්ද පිළිබඳ අවුරුදු පතා ලිපි ලිව්වෙමි. මේ ලිපිවලින් සමහරක් සිංහල අවුරුද්ද මැයෙන් පළවී ඇති පොතෙහි සඳහන් වෙයි. ඒ ලිපි අතර ඇතැම් ලිපියක පොළොවේ අක්ෂය තම කක්ෂයට ආනත ව (ඇලව) තිබීම ගැන පමණක් නොව ඒ අක්ෂය අයනය වීම හේතුවෙන් බටහිර දින දර්ශනයට සාපේක්ෂව සිංහල අවුරුද්ද ලබන වෙලාව වසරින් වසර ඉදිරියට යන අන්දම ද සාකච්ඡා කෙරී ඇත. එහෙත් ඒ බව නොදත් පඬියකු අනෙක් අය කතා නොකරන්නේ යැයි කියන ඇලයක් ගැන කතාකර ඇත. මේ පඬියන්ට කළ හැක්කේ බටහිරින් ලබාගත් තොරතුරක් සඳහන්කිරීම පමණකි. ඔවුන්ට නිර්මාණාත්මක ව කිසිවක් කිරීමට නො හැකි ය. ඒ කෙසේ වෙතත් එවැනි පඬි ලිපි පිනක් අත් නොවුවත් නොනගතයේ දී කියවීමට නම් සුදුසු ය.

මේ ලිපියේ අරමුණ මේ පඬියන්ගේ පඬිවදන් ගැන සඳහන්කිරීම නො වෙයි. පසුගිය නෙනානගතයේ දී හෝ නෙනානගතය ආසන්නයේ දී හෝ සිදු වු සිංහල බෞද්ධ විරෝධි වැඩ ඇල්ලීම් දෙකක් ගැන මෙහි සාකච්ඡා කෙරෙයි. එකක් මෙරට ඇතැම් නාගරිකයන් ගෙදර යන ගමන් යන සුපිරි වෙළෙඳශාලා දාමයක් ක්‍රියා කළ ආකාරය ය. අනෙක් එවැනි වෙළෙඳසල් ද එසේ ක්‍රියා කෙළේ දැයි නො දනිමු. එහෙත් සිංහල බෞද්ධයන්ගේ හා අදාළ ඇමතිතුවරුන්ගේ අවධානය මෙයට යොමුවනු දැකීමට කැමැත්තෙමි. මේ සුපිරි වෙළෙඳසැල් නොනගතය උදාවීමෙන් පසුව ද එදින රාත්‍රී එකොළහ වන තුරු විවෘතකර තැබීමට කටයුතු කර ඇත. ඒ වෙළෙඳසල් අත්‍යවශ්‍ය සේවාවක් ඉටු නොකරයි. අත්‍යවශ්‍ය සේවයක් යනුවෙන් මෙහි දී අදහස් කෙරෙන්නේ තුන්සිය හැටපස් දවසෙහි ම පැය විසිහතර පුරාම සිදුවිය යුතු සේවයකි. රෝහල්වල කෙරෙන සේවය ගමනාගමන සේවය, බෙහෙත්සල්වල සේවය, ජලය හා විදුලිය ලබාදීම එවැනි අත්‍යවශ්‍ය සේවාවන් සඳහා උදාහරණ වෙයි. මේ සුපිරි වෙළෙඳසල් එදා රාත්‍රියේ විවෘතකර තිබුණේ මහජන සේවය සඳහා ද?

එහි දී කරුණු දෙකක් සිදුවිය. පළමුවෙන් ම ඒ වෙළෙඳසල්වල සේවය කරන සේවකයනට නොනගතයෙහි වැඩ අත්හැරීමට නොහැකිවිය. කළමණාකරණ ප්‍රධානීන් කෙසේ වෙතත් මේ සේවකයන්ගෙන් බහුතරය සිංහල බෞද්ධයෝ වෙති. පාලකයන් මේ සේවකයන්ට අඩුම තරමින් එක් දිනක් මෙරට සිංහල බෞද්ධ සිරිත් විරිත් අනුව ජීවත්වීමට ඇති අයිතිය පැහැරගෙන ඇත. නගරවල අනෙක් කඩ එදින වෙනදාට කලින් වැසෙද්දී මේ සුපිරිකඩ රාත්‍රියේ ද විවෘතකර තිබිණි. පාලකයන් කියනු ඇත්තේ සේවකයන්ට නියමාකාරයට වැටුප් ගෙවන බව ය. අද අප සියල්ලන්ම පාහේ වැටුප් ලබන දීන කුලීකරුවන් වී ඇති බව සැබෑ ය. එහෙත් වැටුප් සොච්චමක් ගෙවා අප තවත් දීනයන් කරන්නේ කාගේ වුවමනාවට ද?

දෙවැනුව මේ සුපිරිකඩ විවෘතව තබා ඇත්තේ සිංහල බෞද්ධයන්ට නොනගතයට ද කඩේ යෑමට පුරුදු කිරීමට බව පැහැදිලි ය. සිංහලයන් දැන් එක එකාට කඩේ යන බව සැබෑ ය. එසේ කඩේ ගියත්, අවුරුද්දේ තුන්සිය හැටදවසක්ම ක්‍රිස්තියානි සංස්කෘතියක ජීවත්වීමට සිදු වී ඇතත්, අවුරුද්ද ද බොහෝ දුරට බටහිර ක්‍රිස්තියානි වෙළෙඳ සංස්කෘතියට යටවී ඇතත්, සිංහල බෞද්ධයෝ අවුරුද්දේ දින කිහිපයක්වත් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ජීවත්වීමට කැමති වෙති. සුපිරි කඩේට අවශ්‍ය සිංහල බෞද්ධයන් නොනගතයට කඩේ යෑමට පුරුදුකර අර දින කිහිපයත් ඔවුන්ට නැතිකිරීම ය. මෙහි දී පඬියන් සිංහල බෞද්ධයනට නැකැත් පිළිගත හැකි ද ඉර පොළොව වටා යන්නේ ද මේ සිරිත් දෙමළ හින්දු සිරිත් ද, මෙරට ජීවත්වන සිංහල බෞද්ධ නොවන අය සඳහා කඩේ විවෘතකර තැබීම වරදක් ද ආදී දහසක් ප්‍රශ්න නගන බව දනිමු. සිංහලයන්ට නැකැත් කෙළි තිබුණේ මිහිඳු හිමියන් මෙරටට වැඩමකිරීමට ද පෙර ය. සිංහලයෝ කිසි දිනෙක ඒ සිරිත් අත්නොහැරිය හ. මේ දිනවල දෙමළ අවුරුද්දක් නැති බව චෙන්නායි ගියේ නම් දැනගැනීමට තිබුණි. දහහතරවැනි දා හා පහළොස්වැනිදා මෙරට ප්‍රවෘත්ති පත්‍ර පළ නොවුණු නමුත් චෙන්නායි නගරයට හින්දු පුවත්පත පළකිරීම ප්‍රශ්නයක් නොවිණි. ඒ දින දෙකෙහි ද මම හින්දු පුවත්පත කියවීමි. අද මෙරට දෙමළ හින්දු ජනයා ද සිංහල බෞද්ධයන් අනුව යමින් සිංහල අවුරුද්ද හෙවත් ජාතික අවුරුද්ද පවත්වන්නේ නම් එහි වරදක් නැත. එහෙත් පඬියන් සිංහල අවුරුද්දේ සම්භවය පිළිබඳ අමන කතා කිවයුතු නො වේ. අවුරුදු තිහක් පමණ ගැලීලියොගේ හා නිව්ටන්ගේ නොදියුණු මතිමතාන්තර විශ්වවිද්‍යාලවල උගන්වා ඇතත් මට ඉර පොළොව වටේ යන බව පිළිගැනීම ප්‍රශ්නයක් නො වෙයි. පඬියන්ගෙන් අසන්නට ඇත්තේ අපට සාපේක්ෂව ඉර පොළොව වටේ නොගොස් කුමක් වටේ යා යුතු ද යන්න ය.

© Prof. Nalin De Silva

ඉරට ඇති එකම ප්‍රශ්නය පඬියන් ද පොළොවේ සිටින බැවින් ඉරට ඔවුන් වටේ ද යෑමට සිදුවීම යැයි සිතමි. මේ සුපිරි කඩ ඇරියේ සිංහල බෞද්ධ නොවන්නන්ට නොවන බව පැහැදිලි ය. අනෙක් අතට එංගලන්තය වැනි ක්‍රිස්තියානි රටකට ගොස් ඇති පඬියෝ ඒ රටවල පාස්කු හා නත්තල් සතිවල හන්දියෙ කඩේ සිට සුපිරි කඩේ දක්වා සියළු කඩ වසන බව දනිති. සිංහලයන්ට වෙළෙඳාම් කිරීමට ඒ සතිවල සුද්දෝ කඩ නාරිති. එංගලන්තය ක්‍රිස්තියානි සංස්කෘතියට අනුව කටයුතු කිරීම පඬියන්ට ප්‍රශ්නයක් නො වේ. ප්‍රශ්නය ලංකාවේ දවස් දෙක තුනක් වුවත් සිංහල බෞද්ධ සංස්කෘතියට අනුව කටයුතුකිරීම ය.

දෙවැනුව සඳහන්කිරීමට ඇත්තේ බටහිර රටවල් හා එහි සිටින විසුරුණු (ග්‍රීක සම්භවයක් ඇති ඩයස්පෝරා යන බයිබල් වචනයෙන් මුල දී හැඳින්වුණේ විසුරුණු යුදෙව් ගෝත්‍රිකයන් ය.) දෙමළ ජාතිවාදීන් නොනගතයට වැඩ ඇල්ලීම ය. ප්‍රභාකරන් මුලතිව්හි සිටින්නේ යැයි සිතන බටහිර රටවල විසුරුණු දෙමළ ජනයා සහ ඇතැම් බටහිරයෝ ප්‍රභාකරන් ගලවා ගනු පිණිස පසුගිය දිනවල ඒ ඒ රටවල නොයෙකුත් අඬවි ඇල්ලූහ. නෝර්වේහි ලංකා තානාපති කාර්යාලයට පහරදීම එරට පොලිසියේ අනුදැනුම නොමැතිව කළ නොහැක්කකි. බ්‍රිතානියේ ඉන්දීය මහාකොමසාරිස් කාර්යාලයේ නේරු පිළිමයෙහි හිස වෙන්කිරීමට දෙමළ ජාතිවාදීහු ක්‍රියාකළහ. එමෙන් ම ලන්ඩනයේ තේම්ස් නදිය හරහා වැටී ඇති එක් පාලමක වාඩිවී එය වසා දැමීමට දෙමළ ජාතිවාදීන්ට හැකිවිය. ලන්ඩනයේ පොලිසියේ අනුදැනුම නොමැතිව එවැන්නක් කළ නොහැකි ය. මේ රටවල ආරක්ෂක නිලධාරීන්ට ද ප්‍රභාකරන් කොටු වී ඇතැයි සිතන බොහෝ රාජ්‍ය බලවතුන්ට ද ප්‍රභාකරන් ගලවාගැනීමේ වුවමනාවක් වෙයි. බ්‍රිතානිය අපේ ප්‍රධාන සතුරා වන අතර නෝර්වේ බ්‍රිතානිය වෙනුවෙන් කඩේ යන ප්‍රධාන රට වෙයි.

අද අප නෝර්වේ තානාපතිගෙන් පමණක් නොව බ්‍රිතානි මහා කොමසාරිස්ගෙන් ද ප්‍රශ්න කළ යුතු ය. තේම්ස් ගඟේ පාලමක් වසා දැමීම කොටි ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාවක් නොවේ යැයි බ්‍රිතානිය කියනු ඇත. අපි බ්‍රිතානීන් හොඳහැටි හඳුනන්නෙමු. ඔවුන්ගේ වචන හරඹ ගැන අවුරුදු දෙසියයක අත්දැකීම් අප සතුව පවතී. බ්‍රිතානිය කොටි සංවිධානය බොරුවට නිල වශයෙන් තහනම් කර එහි පෙරමුණු සංවිධානවලට අවශ්‍ය ආකාරයෙන් කටයුතුකිරීමට අවසර දෙයි. මේ බ්‍රිතානි කුහකත්වය මිස අනෙකක් නො වෙයි. බ්‍රිතානියේ වසන දෙමළ ජාතිවාදීන්ට තේම්ස් ගඟේ පාලමක් වැසීමට අවස්ථාව සැලසූ ලන්ඩන් පොලිසිය අල් ක්වයිඩා සංවිධානයේ පෙරමුණු සංවිධානවලට ඒ අවසරය ලබාදෙන්නේ ද? අප ජයග්‍රහණය කිරීමට නම් බ්‍රිතානිය අපේ ප්‍රධාන සතුරා ලෙස හඳුනාගෙන අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතු ය.

ලංකාවේ වෙනම දෙමළ රාජ්‍යයක් ඇතිකිරීමේ අවශ්‍යතාව ප්‍රධාන වශයෙන් ම ඇත්තේ බටහිර රටවල විසිරී සිටින දෙමළ ජනයාට හා බටහිර ක්‍රිස්තියානි රාජ්‍යවලට ය. එදා මෙන් ම අද ද සිදුවන්නේ බ්‍රිතානියේ හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අවශ්‍යතාවට උගත් (ප්‍රාචීන භාෂා උගතුන් ආදීන් සිටිය ද උගත් යන්නට වර්තමාන සන්දර්භයෙහි ඇත්තේ එක් ප්‍රධාන අර්ථකථනයක් පමණකි. ඒ බටහිරයන්ගේ අධ්‍යාපනය ලත් යන්න ය. ඊනියා උගත් ගැමි තරුණ පරපුර ද මේ උගත්කම ලැබුවෝ වෙති. ගුණදාස අමරසේකර මහතා මේ අධ්‍යාපනයෙහි හරයට විරුද්ධ නැති බව පැහැදිලි ය. ඔහු විරුද්ධවන්නේ එහි බාහිර අංගවලට ය. ඔහුගේ සාහිත්‍ය කෘතිවලින් ඒ බව පිළිබිඹු වෙයි.) දෙමළ ජනයා යොදාගැනීම ය. මුලතිවුහි කොටු වී ඇතැයි සිතන ප්‍රභාකරන් බේරාගැනීම සඳහා බටහිර ඇතැම්හු හා බටහිර විසිරුණු දෙමළ ජනයා නොනගතයේ දී වැඩ ඇල්ලූහ. අවුරුදු දවස්වල හමුදා ක්‍රියාකාරීත්වය ආරක්ෂක කටයුතුවලට පමණක් සීමාවිය.

හෙට අනිද්දා හමුදාව පූර්ණ ජයග්‍රහණයක් අත්කරගත්ත ද එයින් ප්‍රශ්නය කෙළවර නො වේ. ප්‍රභාකරන් අද හෝ දැනට මාස තුනකට පමණ ඉහත ජනවාරියේදී හෝ පැන ගියේ නම් ඔහු බ්‍රිතානිය ප්‍රමුඛ බටහිර රටවල ද බටහිර විසිරී සිටින දෙමළ ජනයාගේ ද ආධාරයෙන් හා අනුබලයෙන් මුහුදින් එතර ඊළමක් පිහිටුවනු ඇතැයි විශ්වාස කළ හැකි ය. බ්‍රිතානිය පැත්තකට වී නෝර්වේ හා දකුණු ඇමරිකානු රටවල් දෙකක් තුනක් ලවා ඒ ඊළම පිළිගැනුමට ද කටයුතු කරනු ඇත. එසේ වුවහොත් අපට තවත් වැඩ ඇල්ලීමට සිදුවීම නොවැළැක්විය හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva